PRODUCTION COST & MARKET STRUCTURES (Part-III)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

නිෂ්පාදන පිරිවැය

නිෂ්පාදන පිරිවැය නිෂ්පාදන ක්‍රියාවලියෙන් ව්‍යුත්පන්න වූ සංසිද්ධියකි.

මේ නිසා ම කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය යන ස්වරූප දෙක හා සම්බන්ධ ව නිෂ්පාදන පිරිවැයෙහි ද ප්‍රධාන කොටස් දෙකක් පවතී.

- කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය

- දිගු කාලීන නිෂ්පාදන පිරිවැය

ClassWork.LK

කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය

කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විචල්‍ය සාධක හා ස්ථාවර සාධක යන දෙවර්ගය ම භාවිත වන බැවින් කෙටි කාලයේ පහත පිරිවැය වර්ග දෙක පවතී.

- මුළු ස්ථාවර පිරිවැය (TFC)
- මුළු විචල්‍ය පිරිවැය (TVC)
- මුළු පිරිවැය (TC)

මෙම පිරිවැය තත්ත්වලට අතිරේක ව කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය ආශ්‍රිත ව හඳුනාගත හැකි තවත් පිරිවැය සංකල්ප කිහිපයකි.

- සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)
- සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)
- සාමාන්‍ය මුළු පිරිවැය (AC)
- ආන්තික පිරිවැය (MC)

ClassWork.LK

මූළු ස්ථාවර පිරිවැය (TFC)

නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කරගනු ලබන ස්ථාවර සාධක සඳහා දරන පිරිවැය මුළු_ස්ථාවර පිරිවැය(TFC) යි.

මුළු ස්ථාවර පිරිවැය නිමැවුම් ප්‍රමාණය සමඟ වෙනස් නොවේ.

එනම් නිමැවුම් මට්ටම සමඟ මුළු ස්ථාවර පිරිවැය සම්බන්ධයක් නොපෙන්වයි.

නිමැවුම ශුන්‍ය අගයක් ගනු ලැබුව ද ස්ථාවර පිරිවැය අවශ්‍යයෙන් ම දැරීමට ආයතනයට සිදු වේ.

මේ නිසා ම කෙටි කාලයේ දී මුළු ස්ථාවර පිරිවැය ආයතනයට නොවැළැක්විය හැකි පිරිවැයක් වේ.

ClassWork LK

ස්ථාවර පිරිවැයට අයත් ප්‍රධාන සංරචක

- ක්‍රම ක්ෂය ගාස්තු
- දේපොළ බදු
- රක්ෂණ වාරික
- බලපත්‍ර ගාස්තු
- ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවීම්
- කොන්ත්‍රාත් පදනමක් මත බඳවා ගත් කළමනාකරුවන්ට සහ අධීක්ෂකවරුන්ට ගෙවනු ලබන වැටුප්
- ප්‍රාමාණික ලාභ

ClassWork.LK

මුළු ස්ථාවර පිරිවැය වක්‍රය

මුළු ස්ථාවර පිරිවැය නිමැවුම් ප්‍රමාණය සමඟ සම්බන්ධතාවක් නොදක්වන බැවින් එය සැම නිමැවුම් මට්ටමක දී ම ස්ථාවර අගයක් ගනී.

මේ නිසාම මුළු ස්ථාවර පිරිවැය වක්‍රය තිරස් අතට සමාන්තර සරල රේඛාවක් සේ පිහිටයි.



ඉහත ප්‍රස්තාර සටහනට අනුව නිමැවුම ශුන්‍ය මට්ටමේ දී මුළු ස්ථාවර පිරිවැය රුපියල් 50ක් වන අතර නිමැවුම් ප්‍රමාණය 100,200,300,400 ආදී වශයෙන් වැඩි වී ගිය ද මුළු ස්ථාවර පිරිවැය වෙනස් නොවේ.

ClassWork.LK

සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)

නිමැවුම් ඒකකයකට දරන ස්ථාවර පිරිවැය සාමාන්‍ය ස්ථාවර පිරිවැය(AFC)යි. මුළු ස්ථාවර පිරිවැය නිමැවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදීමෙන් සාමාන්‍ය ස්ථාවර පිරිවැය ලබාගනී.

සාමාන්‍ය ස්ථාවර පිරිවැය = මුළු ස්ථාවර පිරිවැය + මුළු නිමවුම් ප්‍රමාණය

$$AFC = \frac{TFC}{Q}$$

නිමැවුම් ඒකක ප්‍රමාණය වැඩි වන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් හීන වේ. එහෙත් ශූන්‍ය නොවේ. මේ නිසා සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය ඍජුකෝණාස්‍රාකාර බහුවලයක හැඩය ගනියි.

එසේ වන්නේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය නිමැවුමෙන් ගුණ කිරීමෙන් ලැබෙන මුළු ස්ථාවර පිරිවැය සැම අවස්ථාවක දී ම එක සමාන වන නිසා ය.

සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රයේ ඕනෑම ලක්ෂ්‍යයක් සම්බන්ධ කොට අදිනු ලබන ඍජුකෝණාස්‍ර ක්ෂේත්‍රඵලය සමාන වීමක් මෙහි දී සිදු වන අතර ඒ මගින් පෙන්නුම් කෙරෙන්නේ ඒ සැම අවස්ථාවක දී ම මුළු ස්ථාවර පිරිවැය සමාන අගයක් වන බව යි.

ClassWork.LK

සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය

නිමැවුම (ඒකක)	මුළු ස්ථාවර පිරිවැය(රු)	සාමාන්‍ය ස්ථාවර පිරිවැය(රු)
100	50	0.5
200	50	0.25
300	50	0.167
400	50	0. 125



ClassWork.LK

විචල්‍ය පිරිවැය (TVC)

නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කරන විචල්‍ය සාධක වන අමුද්‍රව්‍ය, ශ්‍රමය, ඉන්ධන, විදුලි ගාස්තු ආදිය සඳහා දරන්නට සිදුවන පිරිවැය විචල්‍ය පිරිවැය (TVC) වේ.

කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය තුළ ඇතුළත් මුළු විචල්‍ය පිරිවැය නිමැවුම් සමඟ වෙනස් වේ.

නිමැවුම ශූන්‍ය වන විට විචල්‍ය සාධක අවශ්‍ය නොවන බැවින් විචල්‍ය පිරිවැය ශූන්‍ය වන අතර නිමුවම වැඩි වන විට විචල්‍ය පිරිවැය ද වැඩි වේ.

නිමැවුම වැඩි වන විට විචල්‍ය පිරිවැය වැඩි වීමේ වේගය විවිධ නිමැවුම් මට්ටම් අතර වෙනස් වේ.

මේ අනුව නිමැවුම ශූන්‍යයේ දී ශූන්‍යය අගයක් ගන්නා මුළු විචල්‍ය පිරිවැය නිමැවුම පහළ මට්ටම් වල දී අඩු වන වේගයකින් වැඩි වී, නිමැවුම ඉහළ මට්ටම්වල දී වැඩි වන වේගයකින් ඉහළ නගී.

ClassWork.LK



ClassWork.LK

සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)

එක් නිමැවුම් ඒකකයකට දරන විචල්‍ය පිරිවැය ප්‍රමාණය සාමාන්‍ය විචල්‍ය පිරිවැය(AVC) වේ.

මුළු විචල්‍ය පිරිවැය නිමැවුම් ප්‍රමාණයෙන් බෙදීමෙන් සාමාන්‍ය විචල්‍ය පිරිවැය ලබාගත හැකි ය.

$$\text{සාමාන්‍ය විචල්‍ය පිරිවැය} = \frac{\text{මුළු විචල්‍ය පිරිවැය}}{\text{නිමැවුම් ප්‍රමාණය}}$$

$$AVC = \frac{TVC}{Q}$$

ClassWorkLK

සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සාමාන්‍යයෙන් ඉංග්‍රීසි යූ (U) අකුරක හැඩය ගනී.



ClassWork.LK

මුළු පිරිවැය (TC)

නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගනු ලබන සමස්ත විචල්‍ය යෙදවුම් ප්‍රමාණය සහ සමස්ත ස්ථාවර යෙදවුම් ප්‍රමාණය වෙනුවෙන් දරන මුළු වියදම මුළු පිරිවැය (TC) යි.

මුළු පිරිවැය **=** මුළු ස්ථාවර පිරිවැය **+** මුළු විචල්‍ය පිරිවැය

TC = TFC + TVC

නිමැවුම ශූන්‍ය වුව ද මුළු පිරිවැයක් පවතී. ඊට හේතුව ශූන්‍ය නිමැවුමක දී මුළු විචල්‍ය පිරිවැය ශූන්‍ය වුව ද මුළු ස්ථාවර පිරිවැයක් පවත්නා හෙයිනි.

මේ නිසා මුළු පිරිවැය වක්‍රය ආරම්භ වන්නේ ස්ථාවර පිරිවැය ආරම්භ වන ලක්ෂ්‍යයෙන් ය.

නිමැවුම ක්‍රමයෙන් වැඩි කිරීමත් සමඟ මුළු පිරිවැය පහළ නිමැවුම් මට්ටම්වල දී අඩු වන වේගයකින් හා ඉහළ නිමැවුම් මට්ටම්වල දී වැඩි වන වේගයකින් ඉහළ යයි.

Classwork LK

කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී නිමැවුම වැඩි වන විට මුළු ස්ථාවර පිරිවැය නොවෙනස් ව පවතිද්දී මුළු විචල්‍ය පිරිවැය පමණක් වෙනස් වන නිසා මුළු පිරිවැය වෙනස් වීමට බලපාන්නේ මුළු විචල්‍ය පිරිවැය වෙනස් වීම යි.

මේ නිසා මුළු පිරිවැය වක්‍රයේ හැඩය මුළු විචල්‍ය පිරිවැය වක්‍රයේ හැඩයට සමරූපි වේ.

නිමැවුම සමඟ මුළු පිරිවැය සැකසෙන ආකාරය සහ මුළු ස්ථාවර පිරිවැය සහ මුළු විචල්‍ය පිරිවැය මුළු පිරිවැයට සම්බන්ධ වන ආකාරය ප්‍රස්තාර සටහනකින් පහත දැක්වේ.



ClassWork.LK

ඉහත රූප සටහනෙහි 0-M වලින් පෙන්නුම් කෙරෙන්නේ මුළු ස්ථාවර පිරිවැය යි.

නිමැවුම ශූන්‍යයේ දී මුළු විචල්‍ය පිරිවැය ශූන්‍ය වන අතර එම මුළු විචල්‍ය පිරිවැයට 0-M වන මුළු ස්ථාවර පිරිවැය එකතු වීම නිසා මුළු පිරිවැය වක්‍රය M ලක්ෂ්‍යයෙන් ආරම්භ වේ.

ඒ අනුව රූප සටහනෙහි TC සහ TVC අතර ඕනෑම ලම්බක දුරකට TFC අගය සමාන වේ.

TVC අගයත් TC සහ TVC අතර ලම්බක දුරත් (TFC) එකතු වීමෙන් TC වක්‍රය ලැබී ඇත.

නිදසුන් :-

ඉහත රූප සටහනට අනුව

$$b - c = TVC$$
$$b - c = TFC$$
$$(b - c) + (b - a) = TC$$

Class Work.LK

සාමාන්‍ය මුළු පිරිවැය (ATC) යි.

එක් නිමැවුම් ඒකකයකට දරන මුළු පිරිවැය සාමාන්‍ය මුළු පිරිවැය (ATC) යි.

මුළු පිරිවැය නිමැවුමෙන් බෙදීමෙන් සාමාන්‍ය මුළු පිරිවැය ලැබේ.

$$\text{සාමාන්‍ය මුළු පිරිවැය} = \frac{\text{මුළු පිරිවැය}}{\text{නිමැවුම් ප්‍රමාණය}}$$

$$ATC = \frac{TC}{Q}$$

නිමැවුම වැඩි කරන විට, සාමාන්‍ය මුළු පිරිවැය ක්‍රමයෙන් අඩු වී නැවතත් ඉහළ යයි.

සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ හැඩය ද සාමාන්‍යයෙන් ඉංග්‍රීසි යූ (U)අකුරක හැඩය ගනී.

සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය සෑම විට ම සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් පිහිටයි. මෙය පහත ප්‍රස්තාර සටහනෙහි පෙන්නුම් කෙරේ.

ClassWork.LK



ඉහත රූප සටහනට අනුව ලම්බක දුරෙන් දක්වෙන්නේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය යි.

සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් හීන වන අතර ශූන්‍යය නොවේ. නිමැවුම වැඩි වීමත් සමඟ සාමාන්‍ය මුළු පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට සමීප වේ.

එහෙත් කිසි විටෙකත් එය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය මත පතිත නොවේ.

සාමාන්‍ය ස්ථාවර හා සාමාන්‍ය විචල්‍ය පිරිවැයේ එකතුවෙන් සාමාන්‍ය මුළු පිරිවැය සකස්වන නිසා මුළු පිරිවැය වක්‍රයෙහි අවම ලක්ෂ්‍යය පිහිටන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයෙහි අවම ලක්ෂ්‍යයට ඉහළින් ය.

ClassWork.LK

ආන්තික පිරිවැය (MC)

ආන්තික පිරිවැය යනු නිමැවුම එක් ඒකකයකින් වෙනස් කරන විට මුළු පිරිවැය වෙනස් වන ප්‍රමාණය යි.

මුළු පිරිවැයේ වෙනස නිමැවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික පිරිවැය ලැබේ.

$$\text{ආන්තික පිරිවැය} = \frac{\text{මුළු පිරිවැයේ වෙනස}}{\text{නිමැවුමේ වෙනස}}$$

$$MC = \frac{\Delta TC}{\Delta Q}$$

ClassWork.LK

නිදසුන්

නිමවුම (Q) (ඒකක)		මුළු පිරිවැය (TC) (රුපියල්)	
100	ΔQ	500	ΔTC
200	100	1500	1000

$$\text{ආන්තික පිරිවැය} = \frac{1000}{100}$$

$$= \text{රුපියල් } 10$$

කෙටි කාලය තුළ නිමැවුම වැඩි කරන විට ආන්තික පිරිවැය ක්‍රමයෙන් අඩු වී නැවතත් ඉහළ යයි.

ආන්තික පිරිවැය වක්‍රය ද සාමාන්‍යයෙන් ඉංග්‍රීසි යූ (U) අකුරක හැඩය ගනී. මෙය පහත ප්‍රස්තාර සටහනෙහි පෙන්නුම් කෙරේ.

ClassWork.LK



ClassWork LK

ආන්තික පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය, හා සාමාන්‍ය පිරිවැය වක්‍රවල හැසිරීම් රටාව

කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ ආන්තික පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය, හා සාමාන්‍ය පිරිවැය වක්‍රවල හැසිරීම් රටා පහත ප්‍රස්තාර සටහනෙහි පෙන්නුම් කෙරේ.



ClassWork.LK

ඉහත ප්‍රස්තාර සටහනට අනුව,

ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයන්හි අවම ලක්ෂ්‍යය ඡේදනය කරමින් වේගයෙන් ඉහළට ගමන් කරයි.

සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයන් අතරින් සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම ලක්ෂ්‍යයට වම් පසින් සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය ගමන් කරයි.

ආන්තික පිරිවැය අවම වන නිමැවුම් මට්ටම Q_1 වේ. එම අවස්ථාවට අදාළ ආන්තික පිරිවැය 0_1 වේ.

Q_2 නිමැවුම් මට්ටමෙන් පෙන්වන්නේ අවම සමාන්‍ය විචල්‍ය පිරිවැය වන අතර Q3 අවම සාමාන්‍ය මුළු පිරිවැය පෙන්වයි.

ClassWork.LK

කෙටි කාලීන නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංගයන් සංඛ්‍යා ලේඛනයක් මගින්

නිමැවුම ඒකක	මුළු ස්ථාවර පිරිවැය (TFC) රු	මුළු විචල්‍ය පිරිවැය (TVC) රු	මුළු පිරිවැය (TC) රු	සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) රු	සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) රු	සාමාන්‍ය පිරිවැය (ATC) රු	ආන්තික පිරිවැය(MC) රු
0	40	0	40.00	0	0		
1	40	40.00	80.00	40.00	40.00	80.00	40
2	40	70.00	110.00	20.00	35.00	55.00	30
3	40	92.00	132.00	13.33	30.67	44.00	22
4	40	107.00	147.00	10.00	26.75	36.75	15
5	40	117.00	157.00	8.00	23.40	31.40	10
6	40	127.00	167.00	6.67	21.16	27.82	10
7	40	142.00	182.00	5.71	20.29	26.00	15
8	40	164.00	204.00	5.00	20.50	25.50	22
9	40	194.00	234.00	4.44	21.56	26.00	30
10	40	234.00	274.00	4.00	23.40	27.40	40

ClassWork.LK

කෙටි කාලීන පිරිවැය වක්‍ර

කෙටි කාලීන පිරිවැය වක්‍ර හීන වන ඵලදා නීතියේ පිළිබිඹුවකි.

විචල්‍ය සාධකයේ මිල නොවෙනස් ව තිබිය දී විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව ඉහළ යන විට ආන්තික පිරිවැය පහත වැටේ.

ආන්තික ඵලදාව හීන වීමට පටන් ගන්නා විට ආන්තික පිරිවැය ද ඉහළ යෑමට පටන් ගනී.

මේ නිසා කෙටිකාලීන ආන්තික පිරිවැය වක්‍රය ආන්තික ඵලදා වක්‍රයේ ප්‍රතිබිම්බය වේ.

එසේම සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය ද හීන වන ආන්තික ඵලදා නීතියට අනුව ම සාමාන්‍ය ඵලදා වක්‍රයේ ප්‍රතිබිම්බයක් සේ ම පිහිටයි.

මෙලෙසින් වන කෙටි කාලයේ ඵලදායිතා වක්‍ර සහ පිරිවැය වක්‍ර අතර සම්බන්ධය පහත ප්‍රස්තාර සටහනින් නිරූපණය කෙරේ.

ClassWork.LK



ClassWork.LK

ඉහත රූප සටහනට අනුව,

MP උපරිම වන විට MC අවම වේ.

AP උපරිම වන විට AVC අවම වේ.

MP වක්‍රය AP වක්‍රයෙහි උපරිම ලක්ෂ්‍යය ඡේදනය කරමින් වේගයෙන් පහත බසී.

දිගු කාලීන නිෂ්පාදන පිරිවැය

දිගු කාලයේ දී සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් වේ.

නිෂ්පාදනය වැඩි කිරිමෙහි ලා බලපාන කිසි දු සංරෝධයක් දිගු කාලයේ දී දක්නට නොමැත.

ඒ අනුව දිගු කාලයේ දී සියලුම නිෂ්පාදන ආයතන වඩා නම්‍යශීලි තත්ත්වයට පත් වේ.

එසේ ම තම නිෂ්පාදන ධාරිතාව අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීමට ආයතනවලට හැකි ය.

ClassWork.LK

<u>පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණානුකූල නොපිරිමැසුම්</u>

දිගු කාලයේ දී නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵල වශයෙන් පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමාණානුකූල නොපිරිමැසුම් හට ගනියි.

පිරිමැසුම් හා නොපිරිමැසුම් යන දෙක ම නොපවතින විට ස්ථාවර පරිමාණානුකූල ඵල හට ගනියි.

පිරිමැසුම් පවතින විට දී වැඩෙන පරිමාණානුකූල ඵලත් නොපිරිමැසුම් පවතින විට දී අඩු වන පරිමාණානුකූල ඵලත් හට ගනියි.

ClassWork.LK

<u>දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය</u>

පරිමාණානුකූල පිරිමැසුම්වලට හා නොපිරිමැසුම්වලට මුහුණ දෙන නිෂ්පාදන ආයතනයක දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය ඉංග්‍රීසි යූ :ඹ* අකුරක හැඩය ගනී.



ClassWork.LK

පරිමාණානුකූල පිරිමැසුම් / වැඩෙන පරිමාණානුකූල ඵල

පරිමාණානුකූල පිරිමැසුම් යනු දිගුකාලයේ දී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරිමේ දී ආයතනයේ **සාමාන්‍ය පිරිවැය හෙවත් (ඒකක පිරිවැය) පහළ බැසීම** යි.

ආයතනයක ධාරිතාව පුළුල් කිරීමත් සමඟ නිෂ්පාදන සාධකවල කාර්යක්ෂමතාව ඉහළ යෑමත්, නිෂ්පාදන යෙදවුම්වල මිල පහළ වැටීමත් නිසා අත්පත් කරගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හැඳින්විය හැකි ය.

ඉහත රූප සටහනෙහි Q_1 නිමැවුම් මට්ටම දක්වා දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහත වැටීමක් සිදුව ඇති අතර එය පරිමාණානුකූල පිරිමැසුම් පවතින ප්‍රදේශය වේ. එහිදි පවතින්නේ වැඩෙන පරිමාණානුකූල ඵල ය.

ClassWork.LK

පරිමාණානුකූල පිරිමැසුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු

- ධාරිතාව විශාල වීම නිසා හටගන්නා තාක්ෂණික පිරිමැසුම්
- කළමනාකරණය ආශ්‍රිත පරිමාණානුකූල පිරිමැසුම්
- අලෙවිකරණය හා සම්බන්ධ පරිමාණානුකූල පිරිමැසුම්
- මූල්‍යමය පරිමාණානුකූල පිරිමැසුම්
- අවදානම් දැරීම හා සම්බන්ධ පරිමාණානුකූල පිරිමැසුම්

ClassWork.LK

පරිමාණානුකූල නොපිරිමැසුම් / අඩුවන පරිමාණානුකූල ඵල

පරිමාණානුකූල නොපිරිමැසුම් යනු දිගු කාලයේ දී ආයනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කිරිමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය හෙවත් ඒකක පිරිවැය ඉහළ යාම යි.

එනම් ආයතනයක ධාරිතාව පුළුල් කිරීමත් සමඟ නිෂ්පාදන සාධකවල කාර්යක්‍ෂතාව පහළ යෑම නිසා මූල්‍යමය වශයෙන් සිදු වන පාඩුව යි.

ඉහත රූප සටහනට අනුව Q_2 නිමැවුම මට්ටමෙන් පසු දිගු කාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ යෑමක් සිදුව ඇති අතර එම ප්‍රදේශයේ දී නොපිරිමැසුම් පවතී. එහි දී පවතින්නේ අඩුවන පරිමාණානුකූල ඵලය.

ClassWork.LK

පරිමාණානුකූල නොපිරිමැසුම් ඇති වීම කෙරෙහි බලපාන හේතු සාධක

- ධාරිතාව විශාල වීම නිසා හටගන්නා තාක්ෂණික නොපිරිමැසුම්

- කළමනාකරණය ආශ්‍රිත පරිමාණානුකූල නොපිරිමැසුම්

- අලෙවිකරණය හා සම්බන්ධ පරිමාණානුකූල නොපිරිමැසුම්

- මූල්‍යමය නොපිරිමැසුම්

- අවදානම් දැරීම හා සම්බන්ධ පරිමාණානුකූල නොපිරිමැසුම්

Class Work LK

ස්ථාවර පරිමාණානුකූල ඵල

පරිමාණානුකූල පිරිමැසුම් හෝ නොපිරිමැසුම් හෝ නොපවතින විට ආයතනයේ දිගු කාලීන සාමාන්‍ය පිරිවැය ස්ථාවර ව පවතී. එහි දී පවතින්නේ ස්ථාවර පරිමාණානුකූල ඵල ය.

ඉහත රූප සටහනේ Q_1 - Q_2 දුරෙන් දැක්වෙන්නේ එවැනි ස්ථාවර පරිමාණානුකූල ඵල පවතින තත්ත්වයකි.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති
(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura